# ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය රජය විසින් නීතිගත කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරණ පනත මගින් සංස්ථාගත වූ පුස්තකාල වෘත්තීය සඳහා විශිෂ්ට සේවයක් ඉටුකරන ආයතනයකි. එසේම තෘතික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාවේ අංක 01/0724/0140 යටතේ ලියාපදිංචි වී ඇත. ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානයේ (OPA) ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන අතර අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) සාමාජිකත්වයද උසුලයි.

ශ්‍රී ලංකා පුස්තකාල සංගම් පනතට අනුකූලව පහත සඳහන් පරමාර්ථයන් ඉටුකිරීමට සංගමය වෙත බලය පැවරී ඇත.

- ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවාවන්, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම
- පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීම
- පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ වෘත්තීය විභාග පවත්වා ප්‍රවීනත්වය පිළිබඳ සහතික නිකුත් කිරීම
- වෘත්තිය ප්‍රමිතීන් ස්ථාපනය කිරීමේ ජාතික ආයතනයක් ලෙස කටයුතු කිරීම, ඒ අතර ප්‍රධාන වෙයි.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් පවත්වනු ලබන පුස්තකාලයාධිකාරිත්වය පිළිබඳ වෘත්තිය පරීක්ෂණයන් පුස්තකාලයාධිපතිවරුන් බඳවා ගැනීමේදී රජයේ දෙපාර්තමේන්තුද සංස්ථා,මණ්ඩල හා පුද්ගලික ආයතන විසින්ද පිළිගෙන තිබේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 379/1987 අනුව, රාජ්‍ය ආයතන සඳහා පුස්තකාල කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේදී පුස්තකාල සංගමයේ වර්ෂ තුනක ඩිප්ලෝමා පාඨමාලාව කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ වෘත්තිය උසස් සහතිකපත් පාඨමාලාව සමඟ සමාන කර ඇත.

නවීන තාක්ෂණික ක්‍රම ද භාවිත කරමින් පුස්තකාල සම්පත් එක් රැස්කිරීම, සංවිධානය කිරීම, බෙදාහැරීම, පාඨක අධ්‍යාපනය හා වෙනත් පාඨක සේවා පවත්වා ගැනීම පුස්තකාලයාධිපතිවරයකු/වරියක සතු කාර්යය භාරයයි. පුස්තකාල සේවාවන් පිළිබඳව වෘත්තීය මට්ටමින් දැනුමක් ලබාගැනීම හා ප්‍රායෝගික පුහුණුවක් ලබාගැනීමට හැකිවන පරිදි පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සැලසුම් කොට ඇත.

## පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2019 (DIPLIS - 2019)

පුස්තකාල විද්‍යාව පිළිබඳව අධ්‍යාපනය වෘත්තීමය පුස්තකාල සේවාවක් පවත්වාගෙනයාම සඳහා අවශ්‍යම වේ. ලෝකයේ දැනුම වේගයෙන් ප්‍රසාරණය වන අවධියක ශ්‍රී ලංකාව වැනි දියුණුවෙමින් පවතින රටක් එම දැනුම අත්පත් කර ගැනීමට සංවිධානය කිරීම හා විද්‍යාත්මක හා නොයෙකුත් තාක්ෂණික ක්‍රම මගින්, සංවිධානය කරන ලද දැනුම බෙදාහැරීම ද අත්‍යාවශ්‍ය අංගයකි.

මේ අනුව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මෙහෙයවීමෙන් පවත්වනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ වෘත්තීයමය ඩිප්ලෝමා පාඨමාලාව 2019 වර්ෂයේ පැවැත්වීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසා ඇත. අදියර තුනකින් පැවැත්වෙන මෙම පාඨමාලාව පුස්තකාල වෘත්තියකට පිවිසීමට බලාපොරොත්තු වන්නන් හට මූලික මට්ටමේ සිට ම දැනුම ලබා දීමටත්, දැනට පුස්තකාල සේවයේ නියැලී සිටින්නවුන්හට වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමට හැකිවන ලෙසත් සැලසුම් කොට ඇත. සුදුසුකම් ලත් කථිකාචාර්යවරුන් විසින් දේශන මෙහෙයවනු ලැබේ.

මෙහිදී අදියර තුන සඳහා ම එකවර ලියාපදිංචිවීම අවශ්‍ය නැත. එක් එක් අදියර වෙන වෙන ම නිම කිරීමට හැකි වෙයි.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් පවත්වනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර සඳහා අයදුම් කිරීමට පහත සඳහන් මූලික සුදුසුකම් අවශ්‍ය වනු ඇත.

1. මූලික සුදුසුකම්

   a) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම හෝ

   b) i) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත් වී තිබීම සහ,

   ii) අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදි මාධ්‍ය භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් සමඟ ගණිතය සහ ඉංග්‍රීසි ……. භාෂාව ද ඇතුළුව විෂයයන් හයක් (06) සමත්ව තිබීම හෝ

   c) පිළිගත් පුස්තකාලයක ස්ථිර සේවයේ නියුතුව වසර 03 ට නොඅඩු පළපුරුද්ද සහ ඉහත b (ii) සම්පූර්ණ කර තිබීම.

   * පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන්නන් අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

2. පාඨමාලාවේ පළමු අදියර සඳහා විෂයයන්
   1.පුස්තකාලයාධිපතිත්වය
   2.තොරතුරු සංවිධානය - සූචිකරණය
   3. තොරතුරු සංවිධානය - වර්ගීකරණය
   4.පුස්තකාල සම්පත් සහ සේවා

3. පළමු අදියර පාඨමාලා කාලය වසරකට සීමාවේ.

4. පාඨමාලා ගාස්තු
   පළමු අදියර සඳහා පාඨමාලා ගාස්තුව රු.15,500/-කි. ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු.500/- ලෙස මුළු පාඨමාලා ගාස්තුව රු.16,000/-කි. පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අපේක්ෂකයින් පාඨමාලාව ආරම්භ වීමට ප්‍රථම මුදල් එක්වරම ගෙවිය යුතුය. අයදුම්කරන විට ගාස්තු ගෙවිය යුතු නැත. තෝරාගනු ලබන අපේක්ෂකයින් වෙත ගෙවීම් කළයුතු දිනය හා ගෙවීම් කල යුතු ආකාරය සම්මුඛ පරීක්ෂණයකින් පසුව සංගමය විසින් දැනුම් දෙනු ලැබේ.

5. මාධ්‍ය හා මධ්‍යස්ථාන

| මධ්‍යස්ථානය | | මාධ්‍යය |
|---|---|---|
| 1. කොළඹ | - | සිංහල,දමිළ සහ ඉංග්‍රීසි |
| 2. ගාල්ල/මහනුවර/බදුල්ල | - | සිංහල පමණි |
| 3. යාපනය/මඩකලපුව | - | දමිළ පමණි |

6. ප්‍රායෝගික පුහුණුව
   සියළුම ශිෂ්‍යයින් සතියේ වැඩ කරන දින 10ක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුව ලැබිය යුතු පුස්තකාලය අධ්‍යාපන නිලධාරි විසින් නියම කරනු ලැබේ. මෙම පුහුණුව සම්පූර්ණ කරනු නොලැබූ කිසිවෙකුට වර්ෂ අවසානයේ ප්‍රථම අදියර පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

ප්‍රායෝගික පුහුණුව අවසානයේදී පිළියෙල කළ යුතු,

1. පුහුණු වාර්තාව
2. සුචිකරණ වාර්තාව

අනිවාර්යෙන්ම නිබන්ධන ලෙස ලබා දිය යුතුයි.

## 7. පැමිණීම


මුළු දේශන සංඛ්‍යාවෙන් 75%ක දේශන සඳහා සහභාගී නොවූ අපේක්ෂයින්ට වර්ෂය අවසානයේ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

## 8. පුස්තකාල පහසුකම්

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මඟින් විමර්ශනය සඳහා පොත් එකතුවක් පවත්වාගෙන යනු ලැබේ. මෙම පුස්තකාලය කොළඹ 07 නිදහස් මාවතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පරිශ්‍රයේ (National Library and Documentation Services Board) හි පිහිටුවා තිබෙන අතර, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනයන්හි විවෘතව ඇත.

## 9. පරීක්ෂණය

ඒ ඒ අදියර අවසානයේදී (වර්ෂයක කාලය අවසානයේදී) සියලුම විෂයයන් සඳහා විභාග පවත්වන අතර පළමු අදියර සමත් වීමෙන් පසු දෙවන අදියර ද, ඉන්පසු තෙවන අදියර ද සමත් විය යුතු ය. තෙවන අදියර සමත් වීමෙන් පසු ඩිප්ලෝමා සහතිකය ලබා ගත හැකි වන අතර ඉන් අනතුරුව පුස්තකාල සංගමයේ සාමාජිකත්වය හිමි වනු ඇත.




## 10. දුරස්ථ පාඨමාලාව

තැපැල් මාර්ගික පාඨමාලාව පළමු වසර, දෙවන වසර සහ තෙවන වසර සඳහා සිංහල මාධ්‍යයෙන් පමණක් දැනට ක්‍රියාත්මක වේ. එම පාඨමාලාව හදාරන සිසුන් ද මෙම නීති රීති අනුගමනය කළ යුතුය.

<u>ගාස්තු (දුරස්ථ පාඨමාලාව සඳහා)</u>

ප්‍රථම අදියර පාඨමාලා ගාස්තුව රු.18500/- කි. (පාඨමාලා ගාස්තුව රු.18000/- හා ලියාපදිංචි ගාස්තුව රු.500/-).

<u>දුරස්ථ/තැපැල් පාඨමාලා දේශන සටහන් හා පැවරුම්</u>

දුරස්ථ පාඨමාලාව සඳහා ඉහත සඳහන් විෂයයන් හතර යටතේ දේශන සටහන් 40 ක් කාලසටහනක් අනුව ශිෂ්‍යයින්ට බෙදා දෙනු ලැබේ. මේ එක් එක් දේශනයට පැවරුම බැගින්ද ඇතුලත් වේ. පැවරුම් ඇගයීම පුස්තකාල සංගමයෙන් පත්කරනු ලබන දේශක මණ්ඩලයක් විසින් සිදු කෙරේ. පැවරුම් වල ලකුණු පාඨමාලාව අවසානයේදී පැවැත්වෙන පළමු අදියර පරීක්ෂණයේ ලකුණු වලට එකතු කරනු ඇත.

<u>වැඩමුළු (දුරස්ථ පාඨමාලාව සඳහා)</u>

දුරස්ථ පාඨමාලාවට සහභාගී වන සිසුන් සඳහා දෙදිනක වැඩමුළු තුනක් පැවැත්වේ. පාඨමාලාව ආරම්භ කර මාස 3කින් පළමුවැන්නද මාස 6කින් දෙවැන්නද පාඨමාලාව අවසාන වූ විට තුන්වැන්නද පැවැත්වේ. ඒ සඳහා සියළුම සිසුන්ගේ පැමිණීම අනිවාර්යය වන අතර නොපැමිණි සිසුන් හට පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාවක් ලබා දෙනු නොලැබේ. වැඩමුළුව සඳහා ලියාපදිංචි (දුරස්ථ) සිසුන්ගෙන් සහභාගීවීමේ ගාස්තුවක් අය නොකෙරේ.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය:
2019 ජනවාරි 08
කාර්යාලයීය වේලාවන්:
අඟහරුවාදා සිට සෙනසුරාදා දක්වා
පෙ.ව. 9.00 - ප.ව 4.00

# ශ්‍රී ලංකා පුස්තකාල සංගමය



## පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව

## *Diploma in Library and Information Science*

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 275/75,
විද්වත් වෘත්තික මධ්‍යස්ථානය,
මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ 07.

දුරකථන/ෆැක්ස් - 011-2589103
විද්‍යුත් තැපැල - slla@sltnet.lk
වෙබ් ලිපිනය - www.slla.org.lk